# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2358/15 - 2023 නොවැම්බර් මස 14 වැනි අඟහරුවාදා - 2023.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 2(ඇ) වගන්තිය යටතේ කරනු ලබන පත්කිරීම්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 2(ඇ) වගන්තිය ප්‍රකාරව, මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී පනතේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සියළු දිස්ත්‍රික් ලේකම්වරුන්, අතිරේක සුබසාධක කොමසාරිස්වරුන් ලෙස ද සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් නියෝජ්‍ය සුබසාධක කොමසාරිස්වරුන් ලෙස ද පත්කරමි. දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම්වරුන් යන්නට එකී තනතුරෙහි වැඩ බැලීම හා වැඩ ආවරණය කිරීම සඳහා පත්කරන ලද නිලධාරීන් ද ඇතුළත් වේ. මෙම පත්කිරීම් 2023 නොවැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රකාශයට පත්කරමි.

අතිරේක සුබසාධක කොමසාරිස්වරුන් හා නියෝජ්‍ය සුබසාධක කොමසාරිස්වරුන් සඳහා රාජකාරි පැවරීම 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 8(1) වගන්තිය ප්‍රකාරව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සිදු කරනු ඇත.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

EOG 11 - 0151


1A - PG 6527 - 456 (2023/11)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම *අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.